**සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම - 2017**

**-----------------------------------------------------------**

සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**--------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදුකරනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

---------------------------------

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව සමාලෝචිත වර්ෂයට අදාල රු.4,410,836 ක් වූ පොලී ආදායම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් යටතේ සටහන්කර තිබුණද, මුදලින් ලද රු.3,357,912 ක පොලී ආදායම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස සටහන් නොකිරීමෙන් ආයෝජන කටයුතු වල මුදල් ප්‍රවාහය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව සමාලෝචිත වර්ෂය තුලදී විලම්භිත ආදායමෙන් ලියාහල රු.916,978 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් නොවන අයිතමයක් ලෙස ලාභයෙන් අඩුකිරීම වෙනුවට ලාභයට එකතු කිරීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහය රු.1,833,956 ක් වැඩියෙන් සටහන් වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි ,15 ඡේදය අනුව සියළුම බදුවල තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීමක් හඳුනාගත යුතු වුවත්, විගණනයේ ගණනය කිරීම් වලට අනුව සමාලෝචිත වර්ෂයට අදාල රු.34,339,662 ක් වූ විලම්භිත බදු වගකීම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සමාගම විසින් සේවක භාරකාර අරමුදල වෙත 1995 වර්ෂයේදී නිකුත්කරන ලද රු.5,000,000 ක් වටිනා ණයකර වලට අදාලව 2000 ජූනි 15 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගෙවිය යුතු රු. 12,600,000 ක පොලී වියදම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) තේ, රබර්, පොල් හා වෙනත් වගාවන් පරිනත වීමේ කාලය කර්මාන්තයේ සම්මතයන්ට අනුව වර්ෂ 02 සිට වර්ෂ 06 ක පරාසයක පැවතියද, සමාගමට අදාල වගාවන්වල පරිනත වීමේ කාලය හඳුනාගැනීමට නිශ්චිත ප්‍රතිපත්තියක් සමාගමට නොමැති වීමෙන් 2002 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ආරම්භ කළ වගාවන් වෙනුවෙන් ප්‍රාග්ධනිත කර තිබූ රු.149,745,255 ක පිරිවැය පරිනත වගාවන් ලෙස හඳුනාගෙන ඒ සඳහා ක්‍රමක්ෂය ගැලපීම් කර නොතිබුණි.

(ඊ) කොස් ශාකය දැව බවට පත්කිරීම සඳහා නීතිමය අවශ්‍යතා සපුරා ගැනීමට අපහසු වීම හේතුවෙන් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් අගය කිරීමේදී කොස් ශාක වල වටිනාකම වෘත්තීය තක්සේරු කරුවන් විසින් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනා ගනු නොලැබුවත්, සමාගම විසින් කොස් ශාකවල වටිනාකම ලෙස රු.115,109,263 ක් ඇතුලත් කර පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම රු.311,900,488 ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) 1993 වර්ෂයේ සමාගම ස්ථාපිත කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් පවරාදී තිබූ වත්කම් වල ඇතුලත් වී තිබූ රු.87,740,383 ක පරිනත නොවූ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකමට අදාල තොරතුරු සමාගම සතුව නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වත්කම් පරිනත වගාවන් යටතේ හඳුනාගෙන නොතිබුණි.

(ඌ) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා ඇති සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ලෙස රු.2,954,419 ක් පමණක් දැක්විය යුතු වුවද සමාගමේ ප්‍රධාන කාර්යාලය හා වතු අතර සිදුවන ගනුදෙනු ගිණුම් තැබීමේදී නිරවුල් නොවී පැවති රු.14,691,639 ක හර වටිනාකමක්ද, එයට ඇතුලත් කර තිබීම හේතුවෙන් සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ලෙස රු.11,737,219 ක හර ශේෂයක් දක්වා තිබුණි.

(එ) සමාගමේ වතු 5ක් විසින් 2001 වර්ෂයේ සිට 2008 වර්ෂය අතර කාලයේදී ආරම්භ කර තිබූ තේ පැල තවාන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට භෞතිකව නොමැති වුවත් ඒ සඳහා දරන ලද රු.2,062,559 ක පිරිවැය සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති තොගයෙහි ඇතුලත් කර ගිණුම්ගතකර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාගම පිළියෙල කර තිබුණු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සමාගම වෙත ලැබිය යුතු ලෙස ගිණුම්ගතකර තිබූ වටිනාකම් පිළිවෙලින් රු. 1,185,670ක් හා රු. 1,768,749 ක් වුවත් අදාල ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම පිළිවෙළින් රු. 8,723,922 ක් හා රු. 1,743,955 ක් වීම හේතුවෙන් අදාල වටිනාකම අතර පිළිවෙළින් රු.7,538,252 ක් හා රු.24,794 ක වෙනසක් නිරූපණය විය.

(ඔ) සමාගම විසින් හලාවත වැවිලි සමාගමෙන් 2010 වර්ෂයේදී ලබාගත් රු.20,000,000 ක් වූ මූලික ණය මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.22,750,674 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් රු.2,750,674 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) පිරිවැය රු.96,476,872 ක් වූ දේපල පිරියත හා උපකරණ වටිනාකම තහවුරු කර ගැනීමට අවශ්‍ය ස්ථාවර වත්කම් ලේඛනය හා වාහන වලට අදාල වාහන ලියාපදිංචි සහතික යනාදී ලේඛන සමාගම විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ක) වටිනාකම පිළිවෙලින් රු.72,586,179 ක් හා රු.1,831,975 ක් වූ ණයගැති හා ණයහිමි ශේෂ තහවුරු කර ගැනීමට අදාල ශේෂ සනාථන ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඛ) සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති අඩමාණ ණය වෙන්කිරීම් ශේෂය රු.4,186,615 ක් වුවත් එම වටිනාකම ගණනය කිරීමට යොදා ගෙන තිබූ ණයගැති ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ග) වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ සටහන් කර තිබූ වටිනාකම රු.3,777,650 ක් වූ ගිණුම් ශේෂ 10 ක් තහවුරු කර ගැනීමට අදාල තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය ව්‍යාවනය

-----------------

මෙම වාර්තාවේ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

#### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන නොමැති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකූල නොවීම්.

------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 හා 16 වැනි වගන්ති | සේවායෝජක විසින් සේවකයාට අදාල දායක මුදල් ඊලඟ මාසයෙහි අවසන් දිනට පෙර සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වුවත් සමාගම නියමිත දිනට පෙර දායක මුදල් නොගෙවීම හේතුවෙන් 2016 හා 2017 වර්ෂය සඳහා රු.4,331,277 ක මුදලක් අධිභාර ලෙස ගෙවීමට සිදු වී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ II වන කොටසේ (I) ඡේදය | සේවකයෙකු සේවයෙන් අස්වී හෝ විශ්‍රාම ගොස් මාසයක් තුල පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවත්, 1995 අප්‍රේල් 01 දින සිට 2017 ඔක්තෝබර් 31 දක්වා සේවයෙන් ඉවත් වූ සේවකයින් 1,093 කට නොගෙවූ එකතුව රු.103,300,180 ක් වූ පාරිතෝෂික වගකීම් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ගෙවා නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) තත්කාර්යය අතුරු අග්‍රිමයක් කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 14 කදී ලබාගත් අත්තිකාරම් වටිනාකම රු.1,283,048 ක් අදාල කාර්යය නිම වී වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද, එම මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ii) මාණ්ඩලික නිළධාරීන්ට වරකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දිය හැකි වුවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු සඳහා එම සීමාව ඉක්මවා අවස්ථා 4 ක දී රු.152,000 සිට රු.304,000 දක්වා පරාසයක අත්තිකාරම් සමාගම විසින් ලබා දී තිබුණි. |
| (ඈ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අනුමත වැටුප් හා දීමනා වල ඇතුලත් නොමැති වැටුප් හා දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් අදාල අනුමැතියකින් තොරව සමාගමේ සභාපති හා වැඩබලන සාමාන්‍යාධිකාරී සඳහා රු.1,045,930 ක මුදලක් "කම්කරු දීමනා" ලෙස ගෙවා තිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගමේ සභාපතිවරයාට මාසිකව හිමි ඉන්ධන දීමනාව ලීටර් 170 ක් වූ අතර එම සීමාව ඉක්මවීමේදී අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියක් නොමැතිව අනුමත ඉන්ධන සීමාව ඉක්මවූ ලීටර් 4,719 ක් සඳහා රු.519,090 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් දරා තිබුණි. |
| (ඊ) | 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016 | වාහනයක් කුලී පදනම මත ලබා ගැනීමේදී මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ පමණක් වාහන ලබා ගත යුතු බව සහ ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි මෝටර් රථ කුලියට ලබාදෙන ආයතනයකින් කල්බදු ක්‍රමය යටතේ වාහනයක් ලබා ගත යුතු වුවත් සමාගමේ සභාපතිවරයාගේ භාවිතය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2016 ඔක්තෝබර් 20 සිට 2017 ඔක්තෝබර් 19 දක්වා වූ වර්ෂය සඳහා පුද්ගලික වාහනයක් මාසික කුලී පදනම මත ලබාගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.37,088,435ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.62,756,178ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.99,844,613 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේදී අනෙකුත් මෙහෙයුම් ආදායම් රු.66,918,564 කින් වැඩිවීම හා ප්‍රධාන බෝග වගාවන්ගෙන් ලද අලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.30,126,909 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව, 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ තේ හෙක්ටයාරයක සම්මත වාර්ෂික නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 1595 ක් වුවද, සමාගම විසින් පාලනය කරනු ලබන වතු 6 හි වාර්ෂික තේ ඵලදාව කිලෝග්‍රෑම් 390 ත් 876 ත් අතර පරාසයක පැවතුණි. මේ සඳහා සමාගම විසින් වර්ෂ 50 කට වඩා පැරණි හෙක්ටයාර් 447 ක ඇට තේ වගාවක් නඩත්තු කිරීම හා ඵලදාව ඉහල රිකිලි තේ වගාව සඳහා අඛණ්ඩව යොමු නොවීම අඩු අස්වැන්නක් ලැබීමට හේතු වී තිබුණි.

(ආ) සමාගමේ තේ වගාවන් පවතින වතුයායන් 6 හි තේ දළු කිලෝ එකක දායකත්වය වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට ඍණ අගයක් ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල ඍණ දායකය රු.13 ත් රු. 70 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව, 2017 වර්ෂයේදී තේ හෙක්ටයාරක සම්මත වාර්ෂික නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 1,595 ක් වුවද, සමාගමේ බාහිර වැවිලිකරුවන් විසින් පාලනය කරනු ලබන හෙක්ටායර් 334 හි හෙක්ටයාරයක නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 06-89 ක් අතර පරාසයක පැවතුණි. ඒ අනුව බාහිර පාර්ශයවන් විසින් පාලනය කරනු ලබන තේ වගා ඉඩම් ප්‍රමාණය මගින් සම්මත ඵලදාව ලබා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඈ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව සමාලෝචිත වර්ෂයට අදාල ආර්.එස්.එස්.1 වර්ගයේ රබර් කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය මිල රු.337 ක් වුවද, සමාගම විසින් අලෙවි කළ රබර් කිලෝග්‍රෑම් එකක් සඳහා පෞද්ගලික ආයතනයන්ගෙන් ලැබී තිබූ මිල රු.304 ත් රු. 278 ත් අතර පරාසයක පැවතුණි.

(ඉ) සමාගමේ වතුයායන් 4 ක පවතින හෙක්ටයාර් 292 ක් වූ පොල් වගාව තුලින් සමාලෝචිත වර්ෂයේදී ලැබුනු පොල් ඵලදාව පොල් ගෙඩි 841,964 ක් වූ අතර එම ප්‍රමාණය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 38 කින් අඩු වී තිබුණි. මේ සඳහා වාරි පද්ධති ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක නොකිරීම, සමස්ථ පොල් වගාවන්ගෙන් සියයට 64 ක් ඵලදායී ජීව කාලය ඉක්මවූ වගාවන් වීම හා නැවත වගාවන් ආරම්භ කිරීම ප්‍රමාද වීම ඵලදාව අඩු වීමට හේතු වී තිබුණි.

(ඊ) මිල්ලවාන වතුයායේ පිහිටි හෙක්ටයාර් 45.77 ක් හා හපුස්පිටිය වතුයායේ කොකෝවා වගාව තුලින් සමාලෝචිත වර්ෂයේ ලබාගැනීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත ඵලදාව

කිලෝග්‍රෑම් 17,000 ක් වුවත් සමාලොචිත වර්ෂයේ එලදාව කිලෝග්‍රෑම් 2,305 ක් එනම් ඇස්තමේන්තු ප්‍රමාණයෙන් සියයට 14 එලදාවක් පමණි. කොකෝවා ගසක එලදායී ජීව කාලය වර්ෂ 25-30 ත් වුවද මෙම වගාවෙන් වැඩි ප්‍රමාණයක එලදායී ජීව කාලය ඉක්මවූ වගාවන් වීම, කප්පාදු කිරීම, ජලය යෙදීම හා පොහොර යෙදීම අඛණ්ඩව සිදු නොකිරීම හේතුවෙන් පෙර වර්ෂයට සාපෙක්ෂවද, එලදාව සියයට 30 කින් අඩු වී තිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1993 වර්ෂයේ සමාගම ස්ථාපිත කිරීමේදී හෙක්ටයාර් 4704 ක ඉඩම් ප්‍රමාණයක් ගැසට් පත්‍ර මඟින් සමාගමට ලැබී තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ ඉඩම් පිළිබඳ වාර්තා අනුව හෙක්ටයාර් 4054 ක් පමණක් සමාගම විසින් පාලනය කරමින් පවතින බව නිරීක්ෂණය විය. ඉතිරි හෙක්ටයාර් 650 ට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) සමාගමේ වතුයායන් විසින් වර්තමානය විට පාලනය කරනු ලබන හෙක්ටයාර් 4054 ක භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2624 ක පමණක් වගා කටයුතු සිදු කරනු ලබන අතර ඉතිරි හෙක්ටයාර් 1430 ක ප්‍රමාණය වගා කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම සතු මාතලේ පවතින වතු ආශ්‍රිතව 2003 වර්ෂයේදී ඉදිකර තිබූ ගොඩනැගිල්ල වෙත කොළඹ පිහිටි සමාගමේ ප්‍රධාන කාර්යාලය ගෙනයාමට පොදු ව්‍යාපාර කාරක සභාව විසින් ලබා දී තිබූ නිර්දේශය සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබූ අතර අදාල ගොඩනැගිල්ල නිශ්කාර්යයව පැවතුණි.

(ආ) මූල්‍ය අක්‍රමිකතා මත වැඩ තහනම්කර තිබූ වතු අධිකාරීවරයකුට අදාලව කම්කරු කොමසාරිස්වරයා ඉදිරියේ සමාගම හා අදාල නිළධාරියා අතර ඇතිකර ගනු ලැබූ ලිඛිත එකඟතාවය අනුව සේවා තහනමට ලක් වූ කාලයට අදාල හිඟ වැටුප් හා දීමනා රහිතව නැවත සේවයට බඳවාගෙන තිබුණද දේශපාලන පළිගැනීම් සඳහා වන්දි ගෙවීම් යටතේ සේවා තහනමට ලක් වූ කාලයට අදාල වැටුප් හා දීමනා ලෙස රු.2,694,669 ක් ගෙවීමට තීරණය කර රු.1,600,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) සමාගම විසින් සිදුකළ විනය පරීක්ෂණයකට අනුව 2010 වර්ෂයේදී චෝදනා 15 කින් 14 කට වරදකරු වී තිබූ වතු අධිකාරීවරයකු 2013 වර්ෂයේදී සේවා තහනමට ලක් කර තිබුණද අදාල විනය බලධාරී විසින් කිසිදු ක්‍රියාමාර්ගයන් නොගෙන හිඟ වැටුප් හා දීමනා රහිතව 2013 සැප්තැම්බර් 27 දින නැවත සේවයට බඳවාගෙන තිබුණි. දේශපාලන පළිගැනීම් සඳහා වන්දි ගෙවීම් යටතේ සේවා තහනමට ලක් වූ කාලයට අදාල වැටුප් හා දීමනා ලෙස රු.1,304,119 ක් ගෙවීමට තීරණය කර රු.785,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඈ) ඇල්කඩුව වතුයායට අයත් රත්වත්ත වතුයායේ පිහිටි තිරිවාණා නිධිය වර්ෂ 05 ක කාලයකදී කැණීම් සඳහා ගල් කියුබ් එකක් එකතු කළ අගය හා ජාතිය ගොඩනැගීමේ බදු ඇතුලත්ව රු.13,650 කට මිලදී ගැනීමට එකඟ වුවද 2018 ජනවාරි සිට ජුනි 14 දින දක්වා ඉවත් කළ කියුබ් 164.47 න් 59.85 කට පමණක් රු.13,650 බැගින් ගෙවා තිබූ අතර, ඉතිරි කියුබ් 104.62

අපතේ ගිය තිරිවාණා (Waste Quartz) ලෙස හඳුන්වා කියුබ් එකක් රු.13,650 බැගින් මිලදී ගැනීම වෙනුවට රු.1,000 බැගින් ගෙවා බදුකරු විසින් ඉවත්කර ගෙන තිබුණි

(ඉ) සමාගම සතු ඉඩම් හෙක්ටයාර් 358 ක් වූ නෙලවුල්ල වතුයායෙන් හෙක්ටයාර් 233 ක ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් 255 දෙනෙකු විසින් අත්පත්කර ගෙන තිබූ අතර මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කර අදාල ඉඩම් නැවත අත්පත්කර ගැනීමට හෝ බදු පදනම මත ලබා දීමට කටයුතුකර නොතිබුණි.

(ඊ) සමාගමට අයත් බණ්ඩාරපොල තේ කර්මාන්ත ශාලාව 2006 වර්ෂයේ දී පුද්ගලික සමාගමකට වර්ෂ 30 ක කාලයක් සඳහා බදු දී තිබූ අතර, බදුකරු විසින් බදු මුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති රු.27,028,579 ක හිඟ බදු මුදල අයකර ගැනීමට සමාගම කටයුතුකර නොතිබුණි.

**4.4** නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------------

සමාගම සතු කර්මාන්තශාලා 05 න් 02 ක් අක්‍රීයව පවතින අතර අදාල කර්මාන්ත ශාලා මඟින් නිෂ්පාදන කටයුතු සිදු කිරීමට හෝ බදු පදනම මත ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**4.5** **කාර්ය මණ්ඩල පරිපාලනය**
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත කාර්යය මණ්ඩලය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු නාම එකක් යටතේ එක් නිලධාරියකු පුරප්පාඩුව පවතින අතර, තනතුරු නාම එකක් යටතේ එක් නිලධාරීයකු අතිරික්තව සිටී. තවද අනුමත කාර්යය මණ්ඩලය තුල නොමැති නිලධාරීන් තිදෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන තිබුණි.

(ආ) අනුමත කාර්යය මණ්ඩලය තුල ඇතුලත් සාමාන්‍යාධිකාරි තනතුර සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සාමාන්‍යාධිකාරිවරයකු ස්ථිරව 2012 වර්ෂයේ සිට පත්කර ගෙන නොමැති අතර කොන්ත්‍රාත් හා ආවරණ පදනම මත නිලධාරීන් පත්කර තිබුණි.

(ඇ) අනුමත කාර්යය මණ්ඩලයට අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 01 පැවතියද, එම තනතුර සඳහා නිලධාරීන් 03 දෙදෙනෙකු 2017 සැප්තැම්බර් මස සිට පත්කර තිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**
-----------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකල අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | බාහිර පාර්ශවයන් විසින් ඉඩම් අත්පත්කර ගැනීම්, වාහන නඩත්තු හා රක්ෂණ කටයුතු, තේ කර්මාන්තශාලා පවත්වාගෙන යාම දුර්වල මට්ටමක පැවතීම. |

| | | |
|---|---|---|
| (ආ) | අයවැය ලේඛණ පාලනය | අයවැය මගින් ඉලක්ක ස්ථාපිත කර තිබුණද ඒවා සපුරාගැනීමේ ක්‍රමවේදයේ හා අධීක්ෂණ ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම. |
| (ඇ) | ණයගැති හා ණය හිමි පාලනය | දිගුකාලීන ණය ශේෂ නිරවුල් කිරීමට හා අයකර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත බඳවාගැනීමේ පරිපාටියෙන් බැහැරව බඳවාගැනීම් සිදුකර තිබීම. |